# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1686/53 - 2011 ජනවාරි 01 වැනි සෙනසුරාදා - 2011.01.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥාප්ති සංග්‍රහයේ 423 වැනි අධිකාරිය)**

විනිමය පාලන පනතේ 7 වැනි වගන්තිය ප්‍රකාර අවසරය

(423 වැනි අධිකාරය වූ) විනිමය පාලන පනතේ 3 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 7 වැනි වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාගේ විධානයට යටත්ව මේ නිවේදනයෙන් —

ශ්‍රී ලංකාවේ වාසික ඕනෑම පුද්ගලයෙකුට, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ ඕනෑම සමාගමකට හෝ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වී ඇති ඕනෑම හවුල් ව්‍යාපාරයකට මුදල් අමාත්‍යතුමා විසින් 2011 ජනවාරි 01 දිනැති අංක 1686/50 දරන *රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් කර ඇති නියමයන්ට අනුව, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කළ සමාගම්වල කොටස් සහ විදේශීය රජයන් සහ රාජ්‍ය සංවිධාන විසින් නිකුත් කරන ලද ස්වෛරීත්ව බැඳුම්කර අත්පත් කර ගැනීම පිණිස ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන්ට ගෙවීම් සිදුකිරීමට අවසරය ප්‍රදානය කරනු ලැබේ.

මේ නියමයේ කාර්යය සඳහා "ශ්‍රී ලංකාවේ වාසික සහ ශ්‍රී ලංකාවෙන් පිටත වාසික" යන්නට, විනිමය පාලන පනත යටතේ 1972 අප්‍රේල් මස 21 වැනි දින අංක 15007 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද විධානයෙහි ඒ යෙදුමට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

පී. එච්. ඕ. චන්ද්‍රවංශ,
විනිමය පාලක.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ,
ශ්‍රී ලංකා මහ බැංකුවේ දී ය.

1-136

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 013971 — 350 (2011/01)